# 1. 3. 2.

## අලගද්දූපමසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන **අරිට්ඨස්ස** නාම භික්ඛුනො ගද්ධබාධි[1]පුබ්බස්ස එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං හොති: තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි - යථා යෙමෙ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා[2] භගවතා, තෙ පටිසෙවතො[3] නාලං අන්තරායායාති. අස්සොසුං ඛො සම්බහුලා භික්ඛූ: අරිට්ඨස්ස කිර නාම භික්ඛුනො ගද්ධබාධිපුබ්බස්ස එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං: තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි - යථා යෙමෙ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා, තෙ පටිසෙවතො නාලං අන්තරායායාති.

2. අථ ඛො තෙ භික්ඛූ යෙන අරිට්ඨො භික්ඛු ගද්ධබාධිපුබ්බො **තෙනුපසඞ්කමිංසු**. උපසඞ්කමිත්වා අරිට්ඨං භික්ඛුං ගද්ධබාධිපුබ්බං එතද-වොචුං: සච්චං කිර තෙ ආවුසො අරිට්ඨ එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං: තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා යෙමෙ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා, තෙ පටිසෙවතො නාලං අන්තරායායාති?

3. "එවං ව්‍යා[3] ඛො අහං ආවුසො භගවතා ධම්මං දෙසිතං ආජානාමි - යථා යෙමෙ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා, තෙ පටිසෙවතො නාලං අන්තරායායා"ති.

4. අථ ඛො තෙ භික්ඛූ අරිට්ඨං භික්ඛුං ගද්ධබාධිපුබ්බං එතස්මා පාපකා දිට්ඨිගතා විවෙචෙතුකාමා සමනුයුඤ්ජන්ති සමනුගාහන්ති සමනු-භාසන්ති: "මා හෙවං[4] ආවුසො අරිට්ඨ අවච,[5] මා හෙවං ආවුසො අරිට්ඨ අවච. මා භගවන්තං අබ්භාචික්ඛි.[6] න හි සාධු භගවතො අබ්භක්ඛානං.[7] න හි භගවා එවං වදෙය්‍ය. අනෙකපරියායෙනාවුසො[8] අරිට්ඨ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා. අලඤ්ච පන තෙ පටිසෙවතො අන්තරායාය.

1. ගන්ධබාධි, සයා.
2. ධම්මා වුත්තා, මජ්සං. සයා. PTS.
3. බ්‍යා, මජ්සං, සයා. PTS
4. එවං, PTS. සී.
5. අච්ච, මං භගවතා, මජ්සං සයා. PTS.
6. අභිනාවික්ඛ, සයා.
7. අබ්භාචික්ඛන්ං, මජ්සං.
8. අනෙකපරියායෙනාවුසො, මජ්සං.



# 1. 3. 2.

# අලගද්දූපම සූත්‍රය

1. **මා** විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්** නුවර සමීපයෙහි වූ **ජේතවන** නම් **අනේපිඩුසිටුහුගේ** ආරාමයෙහි වැඩවසන සේක. එසමයෙහි ගද්ධබාධිපුබ්බ (ගිජුලිහිණියන් නසන කුලයෙහි උපන්) **අරිට්ඨ** නම් මහණහට **මෙබඳු** ලාමක **දෘෂ්ටියෙක්** උපන: "භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ අනතරායකරධර්ම කෙනෙක් (ස්වර්ගමොක්ෂ දෙකට) අනතරායකරයහ යි යම් සේ වදාරන ලද්දාහු ද, ඒ ධර්මයෝ සෙවනය කරන්නාහට අනතරාය පිණිස අසමර්ථයහ (අනතරායකර නොවෙති) යි මෙසේ මම තථාගතයන් වහන්සේ විසින් දෙසූ ධර්මය දනිමි යි" කියා යි. බොහෝ භික්ෂූහු "ගද්ධබාධිපුබ්බ අරිට්ඨ මහණහට – 'භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ අනතරායකරධර්ම කෙනෙක් ස්වර්ගමොක්ෂ දෙකට අනතරායකරයහයි යම්සේ වදාරන ලද්දාහු ද, ඒ ධර්මයෝ සෙවුනාහට අනතරාය පිණිස සමර්ථ නො වෙති යි මෙසේ මම තථාගතයන් වහන්සේ විසින් දෙසූ ධර්මය දනිමි' යි මෙබඳු පාපදෘෂ්ටියක් උපන්නේල" යි ඇසූහ

2. ඉක්බිති ඒ භික්ෂූහු ගද්ධබාධිපුබ්බ අරිට්ඨ මහණහු කරා එළඹියාහු ය එළඹ ගද්ධබාධිපුබ්බ අරිට්ඨ මහණහට මෙල කීහ: "ඇවැත් අරිට්ඨයෙනි, තට – 'භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ ධර්ම කෙනෙක් (ස්වර්ගමොක්ෂ දෙකට) බාධකයහ' යි යම්සේ වදාරන ලද්දාහු ද, සෙවුනාහට ඒ ධර්මයෝ අනතරාය පිණිස අසමර්ථයහ' යි මෙසේ මම තථාගතයන් වහන්සේ විසින් දෙසූ ධර්මය දනිමි' යි යන පවිටු දෘෂ්ටියෙක් උපන්නේ සැබෑ ද" යි කියා යි

3. "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් පරිද්දකින් යම් මේ අනතරායකරධර්ම කෙනෙක් (ස්වර්ගමොක්ෂ දෙකට) අනතරායකරයහ යි වදාරන ලද්දාහු ද, සෙවුනාහට ඒ ධර්මයෝ අනතරාය පිණිස අසමර්ථයහ යි එවැනි සේ මම තථාගතයන් වහන්සේ විසින් දෙසූ ධර්මය දනිමි" යි කී ය.

4. ඉක්බිති ඒ භික්ෂූහු ගද්ධබාධිපුබ්බ අරිට්ඨ මහණහු ඒ පවිටු දෘෂ්ටියෙන් තොර කරනු කැමැත්තාහු ප්‍රශ්න කරති. ලබ්ධිය පිහිටුවති. කරුණු විචාරමින් මෙසේ කීහ: "ඇවැත් අරිට්ඨයෙනි, මෙසේ නො කියව

ඇවැත අරිට්ඨයෙනි, මෙසේ නො කියව.
ඇවැත් අරිට්ඨයෙනි, මෙසේ නො කියව භාග්‍යවතුන් වහන්සේට අභ්‍යාඛ්‍යාන නො කරව. භාග්‍යවතුන් වහන්සේට අභ්‍යාඛ්‍යානය නො මැනැවි. භාග්‍යවතුන් වහන්සේ මෙසේ නො ම වදාරන සේක් ම ය. ඇවැත අරිට්ඨයෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ලෙසින් අන්තරාය-කර ධර්මයෝ අන්තරායකරයහ යි වදාරන ලදහ. ඒ ධර්මයෝ සෙවුනාහට අන්තරාය පිණිස සමර්ථ වෙත් ම ය



5. අප්පස්සාදා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහූපායාසා, ආදීනවො එත්ථ භිය්‍යො. අට්ඨිකඞ්කලූපමා කාමා වුත්තා භගවතා, -පෙ-* මංසපෙසූපමා කාමා වුත්තා භගවතා, -පෙ- තිණුක්කූපමා කාමා වුත්තා භගවතා, -පෙ- අඞ්ගාරකාසූපමා කාමා වුත්තා භගවතා, -පෙ- සුපිනකූපමා කාමා වුත්තා භගවතා, -පෙ- යාචිතකූපමා කාමා වුත්තා භගවතා, -පෙ- රුක්ඛඵලූපමා කාමා වුත්තා භගවතා, -පෙ- අසිසූනූපමා කාමා වුත්තා භගවතා, -පෙ- සත්තිසූලූපමා කාමා වුත්තා භගවතා, -පෙ- සප්පසිරූපමා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහූපායාසා, ආදීනවො එත්ථ භිය්‍යො''ති.

6. එවම්පි ඛො අරිට්ඨො භික්ඛු ගද්ධබාධිපුබ්බො[1] තෙහි භික්ඛූහි සමනුයුඤ්ජියමානො සමනුගාහියමානො සමනුභාසියමානො තමෙව[2] පාපකං දිට්ඨිගතං ථාමසා පරාමස්ස[3] වොහරති: ''එවං බ්‍යා[4] ඛො අහං ආවුසො භගවතා ධම්මං දෙසිතං ආජානාමි, යථා යෙමෙ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායා''ති.

7. යතො ඛො තෙ භික්ඛූ නාසක්ඛිංසු අරිට්ඨං භික්ඛුං ගද්ධබාධිපුබ්බං එතස්මා පාපකා දිට්ඨිගතා විවෙචෙතුං, අථ තෙ භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං:

8. ''අරිට්ඨස්ස නාම භන්තෙ භික්ඛුනො ගද්ධබාධිපුබ්බස්ස එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං: තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි, යථා යෙමෙ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායාති. අස්සුම්හ ඛො මයං භන්තෙ, අරිට්ඨස්ස කිර නාම භික්ඛුනො ගද්ධබාධිපුබ්බස්ස එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං: තථාහං

භගවතා ධම්මං දෙසිතං ආජානාමි, යථා යෙමෙ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා, තෙ පටිසෙවතො නාලං අන්තරායායා''ති

1. ගද්ධබාධී, සයා. 2. තණ්දව, මජසං. සයා. PTS. 3. පරාමාසා, මජසං. 4. බහා, මජසං. සයා.

* ‘අට්ඨිකඞ්කලූපමා කාමා වුත්තා භගවතා, ඉච්චාදිසු සබ්බත්ථ ‘බහුදුක්ඛා බහූපායාසා, ආදීනවො එත්ථ භිය්‍යොති’ පාඨසෙසො පෙය්‍යාලමුඛෙන දට්ඨබ්බො. පොත්ථකෙසු පෙය්‍යාලවචනං න දිස්සති.



5. භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ අල්පාස්වාද ඇත්තාහු ය යි ද, බොහෝ දුක් ඇත්තාහු ය යි ද, බොහෝ දැඩි වෙහෙස ඇත්තාහු ය යි ද, මෙහි ආදීනව බොහෝ ය යි ද, වදාරන ලද්දාහ.'' – භාග්‍යවතුන් වහන්සේ විසින් ‘කාමයෝ ඇටසැකිල්ලකට බඳු උපමා ඇත්තාහ... කාමයෝ මාංශපෙශියකට බඳු උපමා ඇත්තාහ... කාමයෝ තණහුලකට බඳු උපමා ඇත්තාහ ... කාමයෝ ගිනි අඟුරුවළකට බඳු උපමා ඇත්තාහ... කාමයෝ සිහිනයකට බඳු උපමා ඇත්තාහ... කාමයෝ පිරුළුවකට බඳු උපමා ඇත්තාහ... කාමයෝ රුක්පලයට බඳු උපමා ඇත්තාහ... කාමයෝ අසිපත හා මස්ලොඹුවට බඳු උපමා ඇත්තාහ... කාමයෝ අඬයටි හුලකට බඳු උපමා ඇත්තාහ... කාමයෝ සර්පහිසකට බඳු උපමා ඇත්තාහ... භාග්‍යවතුන් වහන්සේ විසින් ‘කාමයෝ බොහෝ දුක් ඇත්තාහ, බොහෝ උපායාස ඇත්තාහ, මෙහි ආදීනව බොහෝ ය'යි වදාරන ලදාහ'' යනු යි.

6. මෙසේ ද, ඒ භික්ෂූන් විසින් ගද්ධබාධිපුබ්බ අරිට්ඨ මහණ ප්‍රශ්න කරනු ලබනුයේ ලබ්බිය පිහිටුවනු ලබනුයේ කරුණු විචාරනු ලබනුයේ ඒ පවිටු දෘෂ්ටිය ම දෘෂ්ටිබලයෙන් පරාමර්ශ කොට ගෙන එයට බැසගෙන මෙසේ කියයි: ‘ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ අන්තරායකරධර්ම කෙනෙක් (සගමොක් දෙකට) අන්තරායකරයහ යි. වදාරන ලද්දාහු නම්, ඒ ධර්මයෝ සෙවුනාහට යම්සේ අන්තරාය පිණිස නොවෙත් ද, ඇවැත්නි, එවැනි ලෙසින් ම මම භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසූ ධර්මය දනිමි' යි කීයේ ය.

7. යම් හෙයකින් ඒ භික්ෂූහු ගද්ධබාධිපුබ්බ අරිට්ඨ මහණහු ඒ පවිටු දෘෂ්ටියෙන් තොර කරන්නට නො හැකි වූවාහු ද, ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියාහු ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ

වැද එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළ කළාහු ය:

8. "වහන්ස, ගද්ධබාධිපුබ්බ අරිට්ඨ මහණහට 'යම් මේ අන්තරායකර-ධර්මකෙනෙක් අන්තරායකරයහ' යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්දාහු ද, ඔහු සෙවුනාහට යම්සේ අන්තරාය පිණිස අසමර්ථ වෙත් ද, එසේ මම භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසූ ධර්මය දැනගෙන සිටිමි' යි මෙබඳු ලාමක දෘෂ්ටියක් උපන. වහන්ස, අපි ගද්ධබාධිපුබ්බ අරිට්ඨ නම් මහණහුට 'භාග්‍යවතුන් වහන්සේ විසින් යම් ඒ අන්තරායික ධර්මකෙනෙක් අන්තරායික ධර්මයහ යි වදාරන ලද්දාහු ද, ඔහු සෙවුනාහට යම් සේ අන්තරාය පිණිස අසමර්ථ වෙත් ද, එසේ මම භාග්‍යවතුන් වහන්සේ විසින් වදාළ ධර්මය දැනගෙන සිටිමි' යන මෙබඳු පවිටු දෘෂ්ටියෙක් උපන්නේ ල' යි ඇසුම්හ.